# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2268/5 – 2022 පෙබරවාරි 21 වැනි සඳුදා – 2022.02.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2016 නොවැම්බර් මස 04 වැනි දින අංක 1991/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2016 අංක 274 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2015/LO/20.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: ඉඅ/5/1/283.
2022 ජනවාරි මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සරික්කාමුල්ල (කොට්ඨාස අංක 06, හේනමුල්ල කෙහෙල්වත්ත සුළුනගර සහා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක Ka/PND/16/582 හා 2016.10.06 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – අර්ඩන් ෆොරස්ට් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0860**

උතුරට: පානදුර ප්‍රාදේශීය සභාව භුක්ති විඳින අර්ඩන් ෆොරස්ට් වත්ත සහ පරණ ගාලු පාර; නැගෙනහිරට: පරණ ගාලු පාර; දකුණට: ඒ. එම්. ටී. ප්‍රනාන්දු සහ එම්. එස්. එම්. ෆායිස් හිමිකම් කියන කෝනගහවත්ත; බටහිරට: ජීලාන් මධ්‍ය මහා විද්‍යාලය සහ පානදුර ප්‍රාදේශීය සභාව භුක්ති විඳින අර්ඩන් ෆොරස්ට් වත්ත.

EOG 02 – 0552



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*